*සැ. යු.*- 2021.09.10 දින පළ වූ අංක 2,245 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) සහ IV(ආ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,246 - 2021 සැප්තැම්බර් මස 17 වැනි සිකුරාදා - 2021.09.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1360 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1361 |


*සැ. යු.* - (i) තරුණ වරදකරුවන් (පුහුණු පාසල්) (සංශෝධන) පනත් කෙටුම්පත 2021 සැප්තැම්බර් මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2021 සැප්තැම්බර් මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ඔක්තෝබර් මස 08 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 සැප්තැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1359 - B 82270 — 5,403 (2021/09)

# පළාත් පාලන නිවේදන

## බදුල්ල මහා නගර සභාව

### 1947 අංක 16 දරන මහ නගර සභා ආඥපනතේ 48(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1947 අංක 16 දරන මහ නගර සභා අඥාපනතේ 48(1) වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල මහා නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාර්ගය බදුල්ල මහා නගර සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2020.11.05 දින ඊ 05 දරන සභා අනුමැතිය අනුව තීරණය කර ඇත.

2021.03.12 වන දින *ගැසට් පත්‍රයේ* පළ වූ පරිදි එකී කාල සීමාව තුළ දැනුම් දීම ප්‍රකාර විරෝධතාවයක් නොමැති හෙයින් මෙම *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ගය බදුල්ල මහා නගර සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
බදුල්ල.

2021 අගෝස්තු මස 18 වැනි දින,
බදුල්ල මහ නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *පාරේ නම* | *පටන් ගන්නා ස්ථානය (කැටවල ප්‍රධාන මාර්ගයේ සිට කැටවල අතුරු මාර්ගය දෙසට)* | *අවසන් වන ස්ථානය (කැටවල ප්‍රධාන මාර්ගයේ සිට කැටවල අතුරු මාර්ගය දෙසට)* | *වම්පස වරිපනම් අංක (කැටවල ප්‍රධාන මාර්ගයේ සිට කැටවල අතුරු මාර්ගය දෙසට)* | *දකුණුපස වරිපනම් අංක (කැටවල ප්‍රධාන මාර්ගයේ සිට කැටවල අතුරු මාර්ගය දෙසට)* | *දිග මීටර්* | *පළල මීටර්* |
|---|---|---|---|---|---|---|---|
| 01 | බදුල්ල බණ්ඩාරවෙල කැටවල අතුරු මාර්ගය | **වම**<br>කේ. එම්. ඒ. රන්ඩෝල් මහතාගේ නිවස අසල<br>වරිපනම් අංක 28<br>**දකුණ**<br>එම්. ඩී. එල්. රන්ඩෝල් මියගේ නිවස අසල<br>වරිපනම් අංක 16 | වම<br>පියසිරි විතාරණ මහතාගේ නිවස අසල<br>වරිපනම් අංක 16/1<br>දකුණ<br>පියසිරි විතාරණ මහතාගේ නිවස අසල<br>වරිපනම් අංක 16/1 | 28<br>16/5<br>16/1 | 16<br>16/7<br>16/1 | 120m | 3.03m |

# විවිධ දැන්වීම්

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1524 හා 2007.11.16 දිනැති *ගැසට් පත්‍රය* යටතේ හා අංක 1617 හා 2009.08.28 දිනැති *ගැසට් පත්‍රය* යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත් කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2021 වර්ෂය සඳහා වූ තක්සේරුව 2022 වර්ෂය සඳහා තක්සේරුව ලෙස සම්මත කළයුතු බවටත්, එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 134(1) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට දහයක (10%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2022 වර්ෂයෙහි මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 දිනයන්ට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2022 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, කාර්තු වශයෙන් අදාළ වරිපනම් බදු මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එකී කාර්තුවේ පළමුවන මාසය තුළදී අදළ මුදලින් 5% ක වට්ටමක් ද ප්‍රාදේශීය සභාවට ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

09-98/1

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(3) වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව හා එම විධිවිධාන අනුව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීමේ හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් සලකනු ලබන බව අංක 544(IV)ආ හා 1989.02.03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති නියමයට ඇතුළත් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමා අතුළත පිහිටියාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩු ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ සෑම ඉඩමක් වෙනුවෙන්ම, එකී ඉඩමේ හෙක්ටයාර් එකක් සඳහා 2022 වර්ෂයට රුපියල් 50/- ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අයකිරීමට ද ඒ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 5 හෝ ඊට වැඩි වන සෑම හෙක්ටයාර එකක් මත 2022 වර්ෂය සඳහා රු. 10 ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට මම තීරණය කරමි.

2021 වසරේ අක්කර බදු සඳහා පදනම් කොටගත් සතොක්ෂණය 2022 වසර සඳහා ද සතොක්ෂණය ලෙස පිළිගැනීමටත් තව ද, 2022 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2022 වර්ෂයෙහි

ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ හතරවන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එම කාර්තුවකට මුදලින් 5% ක වට්ටමක් ද ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් ලබා දිය යුතු බවටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

**උපලේඛනය**

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *10% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|---|
| පළමුවන කාර්තුව | 2022 මාර්තු 31 | | 2022 ජනවාරි 31 |
| දෙවන කාර්තුව | 2022 ජුනි 30 | 2022 ජනවාරි 31 | 2022 අප්‍රේල් 30 |
| තුන්වන කාර්තුව | 2022 සැප්තැම්බර් 30 | | 2022 ජූලි 31 |
| හතරවන කාර්තුව | 2022 දෙසැම්බර් 31 | | 2022 ඔක්තෝබර් 31 |

09-98/2

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022 වර්ෂයට අදාළව නියම කර අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

**උපලේඛනය**

| | *රු. ශත* |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25.00 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා :- | |
| (අ) වෙළෙඳ කාර්ය සඳහා යොදවන්නේ නම් | 18.00 |
| (ආ) වෙළෙඳ කාර්ය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම් | 4.00 |

| | රු. ශත |
|---|---|
| සෑම කරත්තයක් සඳහා | 20.00 |
| සෑම අත්කරත්තයක් සඳහා | 10.00 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15.00 |
| සෑම ඇතෙකු සඳහා | 50.00 |

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, වීල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

09-98/3

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම් ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය හා 149 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අංක 2152/37 දරන 2019.12.05 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* නියම කර ඇති පරිදි, මහජන සෞඛ්‍යයට අදාළ වන, වාර්ෂික බලපත්‍රයක් ලබා ගත යුතු, පහත ලැයිස්තු අංක 01, ලැයිස්තු අංක 02, ලැයිස්තු අංක 03, ලැයිස්තු අංක 04 හි දක්වා ඇති යම් වෙළඳාමක් හෝ කර්මාන්තයක් සඳහා යොදගනු ලබන ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින්, එකී පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම මත, පහත උපලේඛන 01 හි නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2022 වර්ෂය සඳහා නියම විය යුතු බවටද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පලක් වන විටදී, ඊට අදළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2021 වර්ෂයේ ලැබීම් වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස 2022 වර්ෂය සඳහා නියම කර අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

**උපලේඛනය 01**

| 1 වන තීරය | 11 වන තීරය |
|---|---|
| වාර්ෂික වටිනාකම රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | 500.00 |
| වාර්ෂික වටිනාකම රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක | 750.00 |
| වාර්ෂික වටිනාකම රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක | 1,000.00 |

**ලැයිස්තු අංක 01**

*අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත*

01. මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම
02. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම
03. සම් පදම් කිරීම
04. රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබා ගැනීම
05. රබර් භාණ්ඩ නිෂ්පාදනය
06. ඔට්ටපාලු ගබඩාකර තැබීම හෝ විකිණීම
07. පොල්කටු අඟුරු හෝ දූව අඟුරු නිපදවීම
08. සත්ත්ව ආහාර නිපදවීම
09. සබන් නිෂ්පාදනය කිරීම
10. අලුත් ලෝහ හෝ පරණ ලෝහ මිලට ගැනීම හෝ ගබඩා කර තබා ගැනීම
11. ලෝහ සුන්බුන් හා අබලි ද්‍රව්‍ය මිලට ගැනීම හෝ ගබඩා කර තබා ගැනීම
12. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ඔපදැමීම
13. වේවැල් භාණ්ඩ නිපදවීම
14. වඩු කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම
15 පොල් ලෙලි පෙඟවීම (පල් කිරීම)
16. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)
17. යන්ත්‍රානුසාරයෙන් දූව ඉරීම
18. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම
19. කෙඳි සායම් කිරීම
20. සම් භාණ්ඩ නිපදවීම
21. රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ නැවත ඇසිරීම
22. ගෑස් මැන්ටල් නිපදවීම
23. පොටි නිපදවීම
24. ඉටිපන්දම් නිපදවීම
25. කපුරු නිපදවීම
26. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
27. රෙදි සෝදන නිල් නිපදවීම
28. ලාකඩ නිපදවීම
29. සුවඳ විලවුන් නිපදවීම
30. පාසල් රටහුණු නිපදවීම
31. ටයර් හෝ ටියුබ් නිපදවීම
32. ටයර් නැවත පිරවීම
33. කිරි පට්ටි හෝ කිරි වෙළඳාම
34. සිමෙන්ති ගබඩා කිරීම, ඇස්බැස්ටස් ගබඩා කිරීම
35. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
36. වැලි කඩදසි නිපදවීම
37. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීම
38. ගඩොල් පිළිස්සීම හා විකිණීම
39. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
40. උළු නිපදවීම හා විකිණීම
41. භාවිතයට ගත් ගෝනි, බැරල් හා භාජන පිරිසිදු කර විකිණීම
42. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම
43. කුරුඳු, කරදමුංගු වේලා සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම
44. ගම් වර්ග නිපදවීම හෝ විකිණීම
45. විෂබීජනාශක වර්ග නිෂ්පාදනය හෝ විකිණීම
46. බැටරි පිරවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. පරණ බෝතල් එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
48. අවමංගල සේවාවක් පවත්වාගෙන යාම
49. ගෘහ භාණ්ඩ නිපදවීම හා ගබඩාකර තබා ගැනීම
50. මැණික් කැපීම හා ඔප දැමීම

51. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම
52. යාන්ත්‍රික බලයෙන් රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
53. පිටි හෝ කුළුබඩු ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. සත්ත්ව ආහාර ගබඩා කර තබා ගැනීම
55. ධාන්‍ය වර්ග ගබඩා කර තබා ගැනීම
56. පොලිතින් හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන කිරීම හෝ විකිණීම
57. සපත්තු නිෂ්පාදනය හා විකිණීම
58. ඉටිපන්දම් නිෂ්පාදනය හා විකිණීම
59. වෙනත් අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත
60. සත්ත්ව පාලනය
61. බිම්මල් නිෂ්පාදනය
62. කැබලි රෙදි අළෙවිය
63. රසකැවිලි නිෂ්පාදනය
64. පලතුරු බීම, සිරප් වර්ග නිෂ්පාදනය
65. බේකරිය

*ලැයිස්තු අංක 02*

*අන්තරාදායක ව්‍යාපාර හෝ කර්මාන්ත*

01. යාන්ත්‍රික බලයෙන් දැව ඉරීම
02. කොප්පරා නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම
03. යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් හෝ වෙනත් යම් තෙල් වර්ගයක් සිඳීම හෝ ගබඩා කර තබා ගැනීම
04. පුළුන් ගබඩා කර තබා ගැනීම හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සකස් කර විකිණීම
05. ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
06. මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය
07. කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය
08. කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම
09. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම
10. ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම
11. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම
12. දර විකිණීම
13. උළු හා ගඩොල් ගබඩා කර තබා ගැනීම හා විකිණීම
14. ටයර් ටියුබ් විකිණීමට ගබඩා කර තබා ගැනීම
15. දැව ආශ්‍රිත ලෑලි නිෂ්පාදනය සහ දැව කුඩු ආශ්‍රිත නිෂ්පාදන
16. කාඩ්බෝඩ් හා කඩදාසි භාවිතයෙන් කරන නිෂ්පාදන ගබඩා කර තබා ගැනීම හා විකිණීම
17. ගල් හා පතුරු ගල් ආශ්‍රයෙන් කරන කර්මාන්ත
18. මැටි හා මැටි ආශ්‍රිත කර්මාන්ත
19. නිමි ඇඳුම් නිෂ්පාදන ආයතන
20. රසායන ආශ්‍රිත රෙදි නිෂ්පාදන කර්මාන්ත
21. රෙදි සේදීම් ස්ථාන
22. බීඩි නිෂ්පාදනය හා ගබඩා කර තබා ගැනීම
23. වාහන අලුත්වැඩියා කර තීන්ත ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම
24. වාහනවල බඳ කොටස අලුත්වැඩියා කර තීන්ත ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම
25. වාහන සේවා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
26. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
27. පරණ පත්තර හෝ කඩදාසි එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
28. පාපැදි, යතුරු පැදි හා මෝටර් වාහන අලුත්වැඩියා කිරීම
29. විසිරි පින්තාරු කිරීම
30. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිෂ්පාදනය හා ගබඩා කිරීම
31. ලෝහ සංස්කාර්යය කර්මාන්ත යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම
32. වෙනත් අන්තරාදායක ව්‍යාපාර හෝ කර්මාන්ත
33. ඉන්ධන පිරවුම්හල

**ලැයිස්තු අංක 03**

*අන්තරාදයක හා අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත*

01. ඩ්‍රයි ක්ලීන් කිරීම හෝ සායම් දැමීම
02. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් කිරීම හෝ බතික් කිරීම
03. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම
04. ශීතකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
05. තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම
06. හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම
07. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම
08. ෆයිබර් නිෂ්පාදන
09. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම
10. ලෝහ වර්ග පෑස්සවීම
11. යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම
12. වාත්තු වැඩපළක් පවත්වාගෙන යාම
13. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
14. මෝටර් වාහන බොඩි තැනීම
15. කෘමිනාශක, දිලීර නාශක, පැළෑටිනාශක හෝ පළිබෝධනාශක නිපදවීම හෝ නැවත පිරවීම
16. විෂබීජ නාශක නිපදවීම සහ මදුරු දඟර නිපදවීම
17. දැව ආරක්ෂණ නිපදවීම
18. ගල් තාර හා සිමෙන්ති ආශ්‍රිත පූර්ව සැකසුම් මධ්‍යස්ථාන
19. වීදුරු භාණ්ඩ නිපදවීම හා ගබඩා කිරීම
20. යකඩ තහඩු ගැල්වනයිස් කිරීම
21. පාස්සන ඊයම් නිපදවීම
22. ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම
23. කටු කම්බි නිපදවීම
24. කම්බි ඇණ නිපදවීම
25. කාබන් කඩදසි හෝ යතුරුලියන රිබන් නිපදවීම
26. බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ කාබන් නිපදවීම
27. ජී. අයි. සී. බාල්දි නිපදවීම
28. වායුසමන යන්ත්‍ර, ශීතකරණ, අධිශීතකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම
29. බ්‍රේක් ලයිනර්, ක්ලච් ලයිනර් නිපදවීම හා අලුත්වැඩියා කිරීම
30. යන්ත්‍රෝපකරණ නිපදවීම
31. විදුලි භාණ්ඩ නිපදවීම
32. රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම
33. සංවායත බැටරි නිපදවීම
34. මෝටර් රථ වාහන එකලස් කිරීම
35. රේඩියේටර් නිපදවීම
36. ඉලෙක්ට්‍රොනික උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම
37. වියළි කෝෂ බැටරි නිපදවීම
38. විදුලි බුබුළු නිෂ්පාදනය සහ අලුත්වැඩියාව
39. වෙනත් අන්තරාදයක හා අප්‍රසන්න ව්‍යාපාර හෝ කර්මාන්ත

**ලැයිස්තු අංක 04**

*අතුරු ව්‍යවස්ථා පනවා ඇති ව්‍යාපාර හෝ කර්මාන්ත*

01. ආහාර පිණිස සතුන් ඝාතනය කිරීම හා ඝාතනය සඳහා රඳවා තබා ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම
02. ආහාර සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම
03. උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
04. එළවළු හෝ පලතුරු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
05. ගල්වලක් සහ ගල් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම
06. තේ, කෝපි කඩ හා කෙටි ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
07. මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

08. මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
09. රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
10. ලැගුම්හල් හා නවාතැන්පලවල් පවත්වාගෙන යාම
11. සංචාරක වෙළෙඳාමක් පවත්වාගෙන යාම
12. සිල්ලර වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
13. හෝටලයක් පවත්වාගෙන යාම

09-98/4

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 (1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම් ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා නියම කර අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

**ඉහත කී උපලේඛනය**

| *අනු. අංකය* | *I තීරුව කර්මාන්තය* | *II වන තීරුව පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01 | අභ්‍යාස පොත් නිපදවීම | 500.00 | 750.00 | 1,000.00 |
| 02 | ඇඳ ඇතිරිලි, කොට්ට උර, තිර රෙදි නිපදවීම හා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 03 | ඇඳුම් මැසීමේ ස්ථාන | 500.00 | 750.00 | 1,000.00 |
| 04 | කඩදාසි බෑග් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1,000.00 |
| 05 | ජී අයි බාල්දි නිපදවා විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 06 | පාවහන් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1,000.00 |
| 07 | පැණි නිපදවා විකිණීම | 500.00 | 750.00 | 1,000.00 |
| 08 | ප්‍රචාරක දැන්වීම් පුවරු/බැනර් සකස් කිරීම | 500.00 | 750.00 | 1,000.00 |
| 09 | බෙලෙක් වැඩපල | 500.00 | 750.00 | 1,000.00 |
| 10 | මදුරු දැල් මසා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 11 | මැටි භාණ්ඩ නිපදවීම/අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |
| 12 | සිමෙන්ති භාණ්ඩ නිපදවීම හා අලෙවිය | 500.00 | 750.00 | 1,000.00 |

09-98/5

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 (1) උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම් ;

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 152 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2021 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනු ප්‍රමාණයට ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා නියම කර අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

**උපලේඛනය**

| *I තීරුව*<br>*2021 වර්ෂයේ ව්‍යාපාරයේ ආදායම* | *II තීරුව*<br>*රු. ශත* |
|---|---|
| රු. 6,000/- නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| රු. 6,000/- ඉක්මවන එහෙත් රු. 12,000/- නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| රු. 12,000/- ඉක්මවන නමුත් රු. 18,750/- නොඉක්මවන විට | 180.00 |
| රු. 18,750/- ඉක්මවන නමුත් රු. 75,000/- නොඉක්මවන විට | 360.00 |
| රු. 75,000/- ඉක්මවන නමුත් රු. 1,50,000/- නොඉක්මවන විට | 1,200.00 |
| රු. 1,50,000/- ඉක්මවන විට | 3,000.00 |

ව්‍යාපාර බදු අදාළ වන ස්ථානයන් :

1. අලෙවි නියෝජිත ව්‍යාපාර (ඇන්කර්/බිස්කට්/සිගරට්)
2. ඇඟළුම් කර්මාන්ත ශාලා
3. ඇළුමිනියම් භාණ්ඩ අලෙවිය
4. ඇස්කණ්නාඩි අලෙවිය
5. ඉංග්‍රීසි බෙහෙත් විකිණීම (ෆාමසි)
6. උකස් මධ්‍යස්ථාන
7. උත්සව ශාලා සැරසිලි කුලියට දීම
8. ඒජන්සි තැපැල් කාර්යාල
9. කාපට් විකිණීම
10. කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
11. කෘතිම මල් අලෙවිය
12. ගල් ස්මාරක විකිණීම
13. ගුවන් විදුලි යන්ත්‍ර අමතර කොටස් අලෙවිය
14. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය
15. ඡායාරූප ශාලා

16. ජංගම සීට්ටු බඩු අලෙවිය
17. ජ්‍යොතිෂ කාර්යාලය
18. ටයර් ටියුබ් විකිණීම, වොල්කනයිස් කිරීම
19. තොග ගබඩාවක් පවත්වාගෙන යාම
20. ත්‍රීවීල් රථ අමතර කොටස් අළෙවිය
21. දන්ත ශල්‍යාගාර
22. දිවා සුරැකුම් මධ්‍යස්ථාන
23. දුරකථන සම්බන්ධ කරන ව්‍යාපාර
24. දුම් පරීක්ෂා කිරීමේ ස්ථාන
25. දේශීය විදේශීය දුරකථන ඇමතුම් හා ජංගම දුරකථන අලෙවිය
26. දේශීය රැකියා නියෝජිත
27. නානකාමර කට්ටල හා පිඟන් ගඩොල් අළෙවි ප්‍රදර්ශනාගාර
28. නිමි ඇඳුම් ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම
29. නිවාස සැලසුම් ඇඳීම
30. පරිගණක වෙළෙඳාම
31. පාපැදි අමතර කොටස් අළෙවිය
32. පාපැදි විකිණීම
33. පාවහන්, කුඩ අලුත්වැඩියා කරන ස්ථාන
34. පාවහන් අළෙවි කරන ස්ථාන
35. පිඟන් භාණ්ඩ අළෙවිය
36. පැල තවාන හා බීජ නිෂ්පාදනය
37. පුවත්පත්, සඟරා වෙළෙඳාම
38. පූජා භාණ්ඩ අලෙවිය
39. ප්‍රධාන නියෝජිතයින්
40. ප්‍රදර්ශනාගාරයක් පවත්වාගෙන යාම (ලීබඩු/මැෂින්/මෝටර් සයිකල් වැනි වෙනත්)
41. ප්ලාස්ටික් බඩු අළෙවිය
42. පොත් සහ ලිපිද්‍රව්‍ය වෙළෙඳාම
43. පොල් විකිණීම
44. පෞද්ගලික ආයුර්වේද මධ්‍යස්ථාන
45. පෞද්ගලික ඉංග්‍රීසි වෛද්‍ය මධ්‍යස්ථාන
46. පෞද්ගලික පන්ති
47. පෞද්ගලික උත්සව ශාලා ව්‍යාපාර
48. බල ප්‍රදේශය තුළ තේ දළු, රබර් කිරි එකතු කිරීමේ ව්‍යාපාරය (ජංගම)
49. බැංකු ව්‍යාපාර
50. බුලත් දුම්කොළ විකිණීම
51. මල් පැල විකිණීම
52. මනි බඩු අළෙවිය
53. මහා පරිමාණයේ කර්මාන්ත ශාලා
54. මංගල ඇඳුම් කුළියට දීම, මිලදී ගැනීම හා අළෙවිය
55. මිරිදිය මසුන් ඇති කිරීම හා අළෙවිය
56. මුදල් ණයට දෙන ස්ථාන
57. මුළුතැන්ගෙයි උපකරණ අළෙවිය
58. මෝටර් රථ අමතර කොටස් අළෙවිය
59. මෝටර් සයිකල් විකිණීමේ ස්ථාන
60. යතුරු පැදි අමතර කොටස් අළෙවිය
61. යන්ත්‍ර උපකරණ කුලියට දීම
62. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
63. රසායනාගාර
64. රටබීම ශාලාවක් පවත්වාගෙන යාම
65. රක්ෂණ ව්‍යාපාර
66. රියැදුරු පුහුණු ආයතන
67. රේස් ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාර
68. රෙදිපිළි විකිණීම

69. ලීසිං මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
70. ලොතරැයි අළෙවිය/අළෙවි නියෝජිත
71. ලේ සාම්පල් එකතු කිරීම
72. වාහන ස්ටිකර් කැපීම/අංක තහඩු අලෙවිය
73. වාහන අලංකරණ උපාංග අලෙවිය
74. වාහන කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
75. වාහන විකිණීමේ ස්ථානයක් (සේල්) පවත්වාගෙන යාම
76. වැලි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
77. විදේශ රැකියා නියෝජිත
78. විසිතුරු භාණ්ඩ වෙළඳාම
79. විදුලි උපකරණ අළෙවිය
80. විදුලි උත්පාදන යන්ත්‍ර කුළියට දීම
81. වීඩියෝ පට කුළියට දීම, ගීත පටිගත කිරීම හා විකිණීම
82. වීදුරු භාණ්ඩ අළෙවිය
83. වෙන්දේසිකරුවන්
84. වේවැල් භාණ්ඩ අළෙවිය
85. සතොස වෙළෙඳ ආයතනයක් පවත්වාගෙන යාම
86. සංගීත භාණ්ඩ, නර්ථන භාණ්ඩ විකිණීම හා අලුත්වැඩියාව
87. සාරි වෙළෙඳාම
88. සාප්පු බඩු අළෙවිය
89. සැපයුම්කරුවන්
90. සිංහල බෙහෙත් විකිණීම
91. සිනමා ශාලා
92. සීමාසහිත සමාගම්
93. සුපිරි අළෙවිසැල්
94. ස්වර්ණාභරණ අළෙවිය
95. සෞඛ්‍ය ආරක්ෂක උපකරණ විකිණීම
96. වෙනත් ඕනෑම භාණ්ඩයක්/ද්‍රව්‍යයක් වෙළඳාම් කිරීම සඳහා
97. පශු වෛද්‍ය මධ්‍යස්ථානය

09-98/6

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂයෙහි තාවකාලික අලෙවි කුටි සඳහා ගාස්තු අය කිරීම්

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවට ඇතුළත් වූ ප්‍රදේශයෙහි ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව විසින් නම් කරනු ලබන ස්ථානයන්හි තාවකාලික අලෙවි කටයුතු සඳහා මෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

| | | |
|---|---|---|
| 01 | තාවකාලික සේල් පොළවල් සඳහා දිනකට ගාස්තු | රු. 500 සිට 1,500 දක්වා |
| 02 | රෙදි සහ අනෙකුත් ද්‍රව්‍ය සඳහා | රු. 250 සිට 1,500 දක්වා |

09-98/7

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා සමාජ ශාලාවලට බලපත්‍ර ලබා දීම

1975 අංක 77 දරන සමාජශාලාවලට බලපත්‍ර ලබා දීමේ පනත මගින් පැවරී ඇති බලතල ප්‍රකාර ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා පරිපාලන සීමාවේ පවත්වන සමාජශාලාවලට මෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | ඉල්ලුම්පත්‍ර ගාස්තු | 150.00 |
| 02. | වාර්ෂික බලපත්‍ර ගාස්තු | 500.00 |

09-98/8

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

2022 වර්ෂය සඳහා සිනමාහල් නොවන මුදල් අයකර පෙන්වන දර්ශන සඳහා වන ප්‍රවේශ පත්‍රයක සඳහන් මුදලින් 15% විනෝද බදු මුදල් වශයෙන් අය කළ යුතු යැයි මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

09-98/9

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා පරිසර බලපත්‍ර ලබා දීම

2000 අංක 53 දරන පාරිසරික සංශෝධන පනත යටතේ පැවරී ඇති බලතල අනුව ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශය සඳහා පරිසර බලපත්‍ර සඳහා ගාස්තු පැනවීමේ දී මෙහි නිරූපිත අනුප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අය කළයුතු යැයි මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

| | *මූලික ආයෝජන මුදල රු.* | *ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 01 | 250,000 ට අඩු | 3,000.00 |
| 02 | 250,001 ත් 500,000 ත් අතර | 3,750.00 |
| 03 | 500,001 ත් 1,000,000 ත් අතර | 5000.00 |
| 04 | 1,000,001 ට වැඩි | 10,000.00 |
| 05 | පරිසර බලපත්‍ර ගාස්තු | 4000.00 |

09-98/10

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා වෙනත් ගාස්තු අය කිරීම්

2022 වර්ෂය සඳහා බදු මුදල් අය කිරීමට අදළ නොවන්නා වූ වෙනත් ගාස්තු පහත සඳහන් අනු ප්‍රමාණ අනුව අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

| | *රු. ශත* |
|---|---|
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 1,000.00 |
| ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම. | 1,000.00 |
| පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම. (වැඩිහිටි) | 100.00 |
| පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම. (ළමා) | 50.00 |
| පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම. (වැඩිහිටි) | 50.00 |
| පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම. (ළමා) | 30.00 |
| (සෑම සාමාජිකයෙකුම සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු වාර්ෂිකව සාමාජිකත්වය අළුත් කර ගත යුතුය) | |
| ප්‍රමාද ගාස්තු දිනකට | 1.00 |
| ප්‍රමාද ගාස්තු දින 31-90 දක්වා | 40.00 |
| ප්‍රමාද ගාස්තු දින 91-180 දක්වා | 60.00 |
| ප්‍රමාද ගාස්තු දින 181 ට වැඩි | 100.00 |
| අයදුම්පත් ගාස්තු | 5.00 |

පොතකට අලාභයක් සිදුවුවහොත් හෝ නැතිවුවහොත් පොතේ වටිනාකම මෙන් දෙගුණයක් හා පොතේ වටිනාකමින් 25% ක් රජයේ ගාස්තු වශයෙන් ගෙවිය යුතුය.

බල ප්‍රදේශයෙන් පිටත පදිංචිකරුවන් සඳහා සාමාජිකත්වය ලබා ගැනීමේදී අවුරුදු 12 ට අඩු වූවන් සඳහා රු. 200 ක් හා අවුරුදු 12 ට වැඩි වූවන් සඳහා රු. 500 ක් බැගින් වූ තැන්පතුවක් තැබිය යුතුය. (මීට අමතරව සාමාජික ගාස්තු ගෙවිය යුතුය.)

| | රු. ශත |
|---|---|
| අනතුරුදායක කොස් ගස් එකක් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීමට ගාස්තුව (එකම ඉඩමක පිහිටි කොස් ගස් කිහිපයක් සඳහා පරීක්ෂණ ගාස්තු වෙනස් නොවේ.) | 1,000.00 |
| කොස් නොවන ඕනෑම වෙනත් අනතුරුදායක ගස් එකක් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීමේ ගාස්තුව (එකම ඉඩමක පිහිටි කොස් නොවන ඕනෑම ගස් කිහිපයක් සඳහා පරීක්ෂණ ගාස්තු වෙනස් නොවේ.) | 500.00 |
| ප්‍රසිද්ධ රැගුම් සඳහා බලපත්‍ර ගාස්තු | 500.00 |
| පාපැදි ඉල්ලුම්පත් ගාස්තු | 20.00 |
| එක් දිනක වෙන්දේසි ගාස්තු | 1,200.00 |
| සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු | 60.00 |
| ගවයෙකු ඝාතනය කිරීම සඳහා තාවකාලික බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු | 1,000.00 |
| දිවුරුම්පිටිය ජල යෝජනා ක්‍රමයේ ජලය ලබා දීමට නව ජල සම්බන්ධතා ගාස්තුව | 6,000.00 |
| ප්‍රාදේශීය සභා මාර්ගවල දූව/පස් ප්‍රවාහනයට මාර්ග පරීක්ෂා කර අනුමැතිය ලබා දීමේදී පසු නොගෙවන ගාස්තුව | 2,500.00 |
| මැණික් පතල් කැපීම සඳහා ස්ථාන පරීක්ෂා කර සහා නිර්දේශය/අනුමැතිය ලබා දීමට පසු නොගෙවෙන ගාස්තුව | 2,500.00 |

සේවාලාභීන් සඳහා ලිපි ලේඛන පිටපත් ලබා දීමේදී එක් පිටපතක් සඳහා රු. 25/- ක මුදලක් සභාවට ගෙවිය යුතුය.

09-98/11

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් සඳහා සැලසුම් අනුමත කිරීම හා ඒ සම්බන්ධ වෙනත් කාර්යයන්, ඉඩම් අනුබෙදුම් හා වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික සඳහා ගාස්තු

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම වන මම සංවර්ධන අවසර පත්‍ර ලබා දීම සඳහා පෙරසැරි ගාස්තු, ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු හා සේවා ගාස්තු අය කිරීම, අදාළ සේවා සඳහා අයදුම්පත්‍ර ගාස්තු අය කිරීම, වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික සඳහා ගාස්තු අය කිරීම, දඩ මුදල් අය කිරීම පහත සඳහන් අනුප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවට තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

| | රු. ශත |
|---|---|
| ගොඩනැගිලි අයදුම්පත් ගාස්තුව | 200.00 |
| භූමි යෝග්‍යතා සහතිකපත් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍ර ගාස්තු | 25.00 |
| වීථිරේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම | 750.00 |
| පිඹුරු අනුමත කිරීමේ ගාස්තු (නාගරික නොවන එක් බිම්කඩක් සඳහා) | 300.00 |

නාගරික සංවර්ධන අධිකාරියෙන් නාගරික ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීම, වෙනත් ඉදිකිරීම් හා ඒ සම්බන්ධ සිලුළු කාර්යයන්, ඉඩම් අනු බෙදුම් හා ඒ සම්බන්ධයෙන් වන සංවර්ධන අවසරපත්‍ර ලබා ගැනීම සඳහා පෙරසැරි ගාස්තු, ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු අය කිරීම 2009.04.17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් ගාස්තු පරිදි අය කිරීම සිදු කළ යුතුය.

උක්ත කලාපයට අයත් නොවන නාගරික ප්‍රදේශයෙන් පිටත පිහිටා ඇති ප්‍රදේශවල ගොඩනැගිලි ඉදිකිරීම, පවත්නා ගොඩනැගිලි වලට අලුතින් කොටස් එකතු කිරීම/නැවත ඉදිකිරීම යන සංවර්ධන කාර්යයන් සඳහා ගාස්තු අය කිරීම පහත පරිදි විය යුතුය.

| *ගෙබිම විශාලත්වය* | *පදිංචිය සඳහා (නේවාසික) රු. ශත* | *වාණිජ හෝ වෙනත් භාවිත රු. ශත* |
|---|---|---|
| වර්ග අඩි 100-500 | 300.00 | 450.00 |
| 501-1,000 | 450.00 | 750.00 |
| වර්ග අඩි 1,000 සිට වැඩිවන සෑම වර්ග අඩි 100 ක් හෝ කොටසකට | 100.00 | 150.00 |

| | | | |
|---|---|---|---|
| 1. | ගොඩනැගිලි සැලසුම් අනුමත කාලය වසරකින් දීර්ඝ කිරීම (නාගරික) | | රු. 1,000.00 |
| 2. | ගොඩනැගිලි සැලසුම් අනුමත කාලය වසරකින් දීර්ඝ කිරීම (ග්‍රාමීය) | | රු. 250.00 |
| 3. | මායිම් තාප්ප ආරක්ෂක බැමි ඉදිකිරීම (ග්‍රාමීය) | නේවාසික දික් මීටර් 1 ක් සඳහා | රු. 300.00 |
| | | වාණිජ හා වෙනත් වර්ග සඳහා (දිග මීටර් 1 ක් සඳහා) | රු. 400.00 |
| 4. | දුරකථන කුළුනු / ඇන්ටනා කුළුණු ඉදිකිරීම (ග්‍රාමීය හා නාගරික) | උස මීටර් 5-20 දක්වා රු.20,000 ක් සහ වැඩිවන සෑම මීටර් එකකටම හෝ කොටසකට රු. 100.00 බැගින් | |

5. නේවාසික සඳහා වූ ඒකකය භාවිතය වෙනස් කිරීම (ග්‍රාමීය)

1. ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්) (පෙරසැරි ගාස්තු)

| | රු. ශත |
|---|---|
| 45 ට අඩු | 250.00 |
| 45-90 | 500.00 |
| 91-180 | 625.00 |
| 181-270 | 750.00 |
| 271-450 | 875.00 |
| 451-675 | 1,000.00 |
| 676-900 | 1,125.00 |

වර්ග මීටර් 901 වැඩිවන එක් එක් වර්ග මීටර් 90 සඳහා රු. 250 බැගින් වැඩිවේ.

6. විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම (ග්‍රාමීය) — රු. මිලියන 5 කට අඩු රු. 2,500.00 ක් සහ වැඩිවන සෑම රුපියල් මිලියන එකකට රු. 50 බැගින්

**අනුකූලතා සහතික නිකුත් කිරීම (ග්‍රාමීය)**

| | | |
|---|---|---|
| ඉඩම් අනුබෙදුම් (ග්‍රාමීය) | i. | පළමු බිම් කොටසකට රු. 500ක් හා ඊට වැඩිවන සෑම බිම් කට්ටියකටම රු. 250.00 බැගින් |
| නේවාසික ඉදිකිරීම් (ග්‍රාමීය) | ii. | වර්ග මීටර් 300ට අඩු රු. 1,500 ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1ට හෝ කොටසකට රු. 5 බැගින් |
| වාණිජ හා වෙනත් ඉදිකිරීම් (ග්‍රාමීය) | iii. | වර්ග මීටර් 100ට අඩු 1,500 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 කට හෝ කොටසකට රු. 10 බැගින් |

| | | |
|---|---|---|
| මායිම් තාප්ප ආරක්ෂක බැමි ඉදිකිරීම (ග්‍රාමීය) | iv. | පළමු දික් මීටර් 100 සඳහා රු. 500 ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1 කට හෝ කොටසකට රු. 5.00 බැගින් |
| දුරකථන/විදුලි සංදේශ කුළුණු | v. | උස මීටර් 5 සිට 20 දක්වා රු. 2,000 සහ ඊට වැඩිවන සෑම මීටර් 1 කට රු. 100 බැගින් |
| විශේෂ ව්‍යාපෘති (ග්‍රාමීය) | vi. | කුඩා පරිමාණ සඳහා රු. 2,500.00<br>මධ්‍ය පරිමාණ සඳහා රු. 5,000.00<br>මහා පරිමාණ රු. 1,0000.00 |

**නිසි බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම/ කොටස් එකතු කිරීම/ නැවත ඉදිකිරීම (ග්‍රාමීය)**

| *ඉදිකිරීමේ අදියර* | *නේවාසික වර්ග මීටර් 01 සඳහා ගාස්තු රු. ශත* | *වාණිජ හා වෙනත් වර්ග මීටර් 01 සඳහා ගාස්තු රු. ශත* |
|---|---|---|
| අත්තිවාරම් වැඩ පමණක් | 100.00 | 250.00 |
| වහල මට්ටම දක්වා (වහලය රහිතව) | 150.00 | 500.00 |
| වහලය ඇතුළුව ඉදිකොට ඇති විට | 200.00 | 750.00 |
| සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට | 250.00 | 1,000.00 |
| මායිම් තාප්ප ආරක්ෂිත බැමි ඉදිකිරීම | 200.00 | 200.00 |

09-98/12

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වන වගන්තිය යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත යම් ඉඩමක් වෙන්දේසිකරුවකු, තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් 1% කට සමාන බද්දක් විකුණුම්කරු, තැරැව්කරු හෝ වෙන්දේසිකරු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

09-98/13

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා සභාව සතු ක්‍රීඩා භූමි හා සභා ශ්‍රවණාගාරය බදු දීමේ දී ගාස්තු අය කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩා භූමි බදු දීමේ දී පහත සඳහන් අනු ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

| ක්‍රීඩා පිටි වෙන් කිරීම එක් දිනක් සඳහා : | | *රු.ශත* |
|---|---|---|
| 01 | ප්‍රා.ස. බල ප්‍රදේශයේ පාසැල් සඳහා | නොමිලේ |
| 02 | ප්‍රා.ස. බල ප්‍රදේශයේ ක්‍රීඩා සමාජ සඳහා | 250.00 |
| 03 | ප්‍රා.ස. බල ප්‍රදේශයෙන් පිටත ක්‍රීඩා සමාජ සඳහා | 500.00 |
| 04 | පෞද්ගලික ආයතන ක්‍රීඩා උත්සව හෝ වෙනත් කටයුතු සඳහා | 1,000.00 |
| 05 | දේශපාලන රැස්වීම් සඳහා | 250.00 |
| 06 | සංදර්ශන, කානිවෙල් සහ වෙනත් කාර්යයන් සඳහා | 1,500.00 |

ශ්‍රවණාගාරය වෙන් කිරීම එක් දිනකට (ඇහැලියගොඩ)

| | | |
|---|---|---|
| 01 | ආදායම් උත්පාදන වැඩසටහන් සඳහා | 3,000.00 |
| 02 | අනෙකුත් වැඩසටහන් සඳහා | 1,000.00 |
| 03 | එක් පුටුවක් සඳහා | 5.00 |

ශ්‍රවණාගාරය වෙන් කිරීම (දම්මුල්ල)

| | | |
|---|---|---|
| 01 | දින සඳහා | 250.00 |
| 02 | දින 01ක් සඳහා | 500.00 |

09-98/14

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවට ඇතුළත් වූ ප්‍රදේශයෙහි ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා පහත සඳහන් අනු ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

| | | *වර්ග අඩියකට*<br>*රු. ශත* |
|---|---|---|
| 01 | බිත්ති හා තාප්ප උපයෝගී කර ගන්නා ප්‍රචාරක දැන්වීම් සඳහා | 25 0 |
| 02. | ස්ථිර දැන්වීම් පුවරු සඳහා | 50 0 |
| 03. | රෙදි මගින් කෙරෙන ප්‍රචාරක දැන්වීම් සඳහා (බැනර් සහ කටවුට්) | 25 0 |
| 04. | ඩිජිටල් මුද්‍රණ දැන්වීමක් සඳහා | 35 0 |

09-98/15

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා ජල බදු අය කිරීම

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවට ඇතුළත් වූ ප්‍රදේශයෙහි 2022 වර්ෂය සඳහා ජල බදු අය කිරීම් පහත සඳහන් අනුප්‍රමාණ අනුව විය යුතු යැයි මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

| | | රු. ශත |
|---|---|---|
| 01 | නිවෙස් සඳහා ස්ථිර බද්ද | 100.00 |
| 02 | ව්‍යාපාරික ස්ථාන සඳහා ස්ථිර බද්ද | 300.00 |
| 03 | මාසික ඒකක 10 දක්වා ඒකකයක් සඳහා (නේවාසික) | 25.00 |
| 04 | මාසික ඒකක 10 ට වැඩි වන විට ඒකකයක් සඳහා (නේවාසික) | 35.00 |
| 05 | මාසික ඒකක 05 දක්වා ඒකකයක් සඳහා (ව්‍යාපාරික) | 25.00 |
| 06 | මාසික ඒකක 05 ට වැඩිවන විට ඒකකයක් සඳහා (ව්‍යාපාරික) | 35.00 |

09-98/16

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂය සඳහා වාහන කුලියට දීමේ දී ගාස්තු අය කිරීම්

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු වාහන කුලියට දීමේ දී පහත සඳහන් අනුප්‍රමාණ අනුව වූ ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට මම තීරණය කරමි.

එම්. පී. තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 අගෝස්තු මස 10 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව,
ඇහැලියගොඩ දී ය.

| | | රු. ශත | |
|---|---|---|---|
| 01 | ට්‍රැක්ටරය දිනකට | 3,600.00 | (උපරිම පැය 8 - ඉන්ධන සහිතව) |
| 02 | ට්‍රැක්ටරය සහ අඩි 75 ටේලරය | 5,200.00 | (උපරිම පැය 8 - ඉන්ධන සහිතව) |
| 03 | බැකෝ ලෝඩර (පැයකට) | 2,500.00 | (උපරිම පැය 8 - ඉන්ධන සහිතව) |
| 04 | ජල බවුසරය (ජලය රහිත පැයකට) | 1,000.00 | (උපරිම පැය 8 - ඉන්ධන සහිතව) |
| 05 | ඩම්පේට්‍රක් ලොරිය (දිනකට) | 8,500.00 | (උපරිම පැය 8 - ඉන්ධන සහිතව) |
| 06 | තණකොළ කපන මැෂිම (පැයකට) | 335.00 | (උපරිම පැය 8 - ඉන්ධන සහිතව) |

09-98/17

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.